Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -සති පාසල

විෂය - මව්බස

2021 ඔක්තෝබර් 25 සිට ඔක්තෝබර් 31

සතිය - 26

ශ්‍රේණිය :- 4

සැකසුම :- ඩබ්.කේ.ටී.මධුෂා මිය /ර/ඇඹි /තුංකම ම.වි. 4 ශ්‍රේණිය බාර

දුවේ පුතේ ....

**පහත ඡේදය ඉරි ඇඳි පද ගැන අවධානය යොමු කරමින් කියවන්න.**

නැගෙනහිර අහසේ හිරු පායා ගෙන එන්නේ තවත් අලුත් දවසක් උදා කරමිනි. අද පාසල් නිවාඩු දිනයකි. මම උදෑසන ම පිබිදී මිදුලට ආවෙමි. වතුසුදු <u>ගස</u> මලින් පිරී ඇත්තේ සුදු<u>මල්</u> වට්ටියක් ලෙසිනි. කඩුපුල් ගසේ ඊයේ රෑ පිපුණු <u>මල</u>, පර වී ඇත. වෙන දා ට ආච්චී එය රාත්‍රියේ දී ම පූජා කරයි. වත්ත පහළ ගස්වල කුරුල්ලන්ගේ කීචි බීචි නාදයෙන් මුළු පරිසරය ම ප්‍රබෝධවත් වෙයි.<u>තාත්තා</u> උදැල්ල ගෙන <u>කුඹුරට</u> යාමට සූදානම් වෙයි. <u>අම්මා</u> ලහිලහියේ ආහාර සූදානම් කරන්නේ අද ඇයත් කුඹුරට යන නිසා ය. මගේ යහළුවන්ගේ තාත්තලා ද කුඹුරු වැඩට යති. අම්මලා ද <u>කුඹුරු</u> වැඩට උදවුවට යති. නිවාඩු දිනයක් බැවින් <u>මම</u> ද කුඹුරට යන්නෙමි. එවිට මගේ යහළුවෝ ද කුඹුරේ දී හමුවෙති. අම්මලා, තාත්තලා කුඹුරු වැඩ අවසන් කරන තුරු අපි සෙල්ලම් කරන්නෙමු. මගේ තාත්තා ගොවි කණ්ඩායමේ නායකයා මෙන් කටයුතු කරයි. නායක ගොවියා උදැල්ල කර තබා ගෙන කුඹුරට බසිද්දී අනෙක් <u>ගොවියෝ</u> ද <u>උදලු</u> කර තබා ගෙන, කුඹුරුවලට බසින්නේ <u>පේළිය</u>කට ය. කුඹුරු කෙටීම <u>කණ්ඩායම්</u> ලෙස එක් ව සිදු කරන අතර නියර බැඳීම ද <u>කණ්ඩායම</u> සාමූහික ව සිදු කරති. අපි නියර දිගේ <u>පේළි</u> සෑදී දුවන්නෙමු. වැඩ කරන <u>අම්මලා</u>, <u>තාත්තලා</u> වෙහෙස මහන්සි නිවා ගන්නටත්, ආහාර ගන්නටත් රැස් වන්නේ ගොඩපර ගස් සෙවණට ය. එකිනෙකා ගෙනෙන ලද ආහාර බෙදා හදාගෙන කෑමට හැකි වන නිසා අපි ද ඊට කැමැත්තක් දක්වමු. අව් රස්නය නිසා ලේන්නු, කුරුල්ලෝ ගොඩපර ගස්වලට වී සිටිති.

**ඉරි ඇඳි පද අනුව ඒක වචන හා බහු වචන පද වෙන් කර ලියන්න**

| ඒක වචන පද | බහු වචන පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |